// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2089/54 – 2018 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා – 2018.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: සී.අයි./1859.

### කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

එක් පාර්ශවයක් වශයෙන් දෙම්පේ, පහළ දෙම්පේ අංක 76/07හි පිහිටා ඇති ස්විස්ටෙක් ඇලුමිනියම් ලිමිටඩ් සහ අනෙක් පාර්ශවය වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2018 ජුනි මස 12 වන දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ 05, කම්කරු දෙපාර්තමේන්තුව.

2018 අංක 26 දරන සාමූහික ගිවිසුම

2018 ජුනි මස 12 වන දින

ස්විස්ටෙක් ඇලුමිනියම් ලිමිටඩ්

සහ

අන්තර් සමාගම් සේවක සංගමය අතර වූ

සාමූහික ගිවිසුම

1A – G 28581 – 11 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සාමූහික ගිවිසුම

2018 ජුනි මස 12 වන දින දෙම්පෙ, පහළ දෙම්පෙ, අංක 76/7 දරන ස්ථානයේ සිය ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන සමාගම් ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද සමාගමක් වන ස්විස්ටෙක් ඇලුමිනියම් ලිමිටඩ් මින්මතු ''සේව්‍යයා'' යනුවෙන් හඳුන්වනු ලබන එක් පාර්ශ්වයකට ද වෘත්තීය සමිති ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ නිසි පරිදි ලියාපදිංචි කරන ලද තලංගම කොස්වත්ත සෙත්සිරි මාවත, අංක 259/9 හි සිය ලියාපදිංචි කාර්යාලයේ පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය මින් මතු ''වෘත්තීය සමිතිය'' යනුවෙන් හඳුන්වනු ලබන අනෙක් පාර්ශවයට ද, ඇතුළත්ව එළඹෙන්නට යෙදුන සාමූහික ගිවිසුමයි.

ඉහත කී වෘත්තීය සමිතිය විසින් ඉහත කී සේව්‍යයා යටතේ ඇති සේවකයන්ගේ සේවා කොන්දේසි සම්බන්ධයෙන් සංශෝධනයක් කරන මෙන් සේව්‍යයා වෙතින් ඉල්ලා සිටින ලදුව ඉන් අනතුරුව පැවති සාකච්ඡාවලින් පසුව ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර පහත සඳහන් ගිවිසුම ඇති කර ගන්නට යෙදුණි.

01. ***ආවරණය වූ සහ බැඳීසිටින පාර්ශවයන්.***– සේව්‍යයා හා වෘත්තීය සමිතිය ද එම වෘත්තීය සමිතියේ සාමාජිකයන් වන මෙම සේව්‍යයා යටතේ එම සමාගමේ සේවය කරනු ලබන මාසික වැටුප් ලබන මෙහෙයුම් ශ්‍රේණිවල (කය වෙහෙසා වැඩ කරන) ස්ථිර පත්වීම් දරන සේවක මහත්ම/මහත්මීන් මෙම ගිවිසුමේ කොන්දේසිවලින් ආවරණය වේ.

02. ***සාමූහික ගිවිසුම බලපවත්නා කාලය.***– මෙම ගිවිසුම 2018 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන අතර එය අවුරුදු 3ක කාලයක් සඳහා වේ. එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට ලිඛිතව තුන් මාසයක කල් දීමකින් අවලංගු කරන තෙක් බල පැවැත්වෙනු ඇත. කෙසේ වුවද 2021 ජනවාරි මස 01 දිනට ප්‍රථම කිසිදු පාර්ශවයක් විසින් එවැනි කල් දීමක් නොකළ යුතු අතර, 2021 මාර්තු මස 31 දිනට ප්‍රථම ගිවිසුම බල රහිත නොවිය යුතුය.

03. ***වැටුප් ප්‍රතිශෝධන.***–

(අ) සේව්‍යයා සහ වෘත්තීය සමිතිය පහත සඳහන් පරිදි මෙම සාමූහික ගිවිසුම බලපැවැත්වෙන කාලය තුළ වැටුප් ප්‍රතිශෝධන කිරීමට එකඟ වේ.
පළමුවන වර්ෂය රු. 2,750/-
දෙවන වර්ෂය රු. 2,750/-
තුන්වන වර්ෂය රු. 2,000/- එකතුව රු. 7,500/-

(ආ) ඉහත කී වැටුප් ප්‍රතිශෝධන හිමි වනුයේ සෑම වසරකම මාර්තු 31 වන දිනට ස්ථිර පත්වීම් දරන සේවක මහත්ම/මහත්මීන් පමණි.
උදා: පළමු වර්ෂයේ වැටුප් වැඩිවීම සඳහා හිමිකම් ලබනුයේ 2018.03.31 වන දින වන විට ස්ථිර පත්වීම් දරන ලද සේවක මහත්ම/මහත්මීන් පමණි.

04. ***රාත්‍රී සේවා මුර දීමනාව.***– දැනට පවතින පැය 12ක සේවා මුරය පැය 8ක සේවාමුරයක් ලෙස මෙහි සඳහන් සියලුම වැඩි කිරීම් සිදුකිරීමෙන් පසු, ඉදිරියේ දී වෙනස් කිරීමට දෙපාර්ශවයම එකඟ වේ. ඒ අනුව පහත පරිදි රාත්‍රි සේවා මුර දීමනා වැඩි කිරීමට එකඟ විය.

* දැනට පවතින පැය 12ක රාත්‍රි සේවා මුරය දීමනාව සඳහා රු. 150ක් ලබාදීමටත්

* පැය 08ක රාත්‍රි සේවා මුරය සඳහා රු. 100ක් ලබාදීමටත්

* අතිකාල රාත්‍රි සේවා මුරය සඳහා රු. 250ක් බැගින් ලබාදීමටත් සේව්‍යයා එකඟ වේ.

05. ***නිල ඇඳුම් මැසීමේ දීමනාව.***– නිල ඇඳුමේ කලිසමක් (01ක්) මැසීම සඳහා අදාළ දිනයන්ට වෙළෙඳපළ පවතින මිළ ගණන් දෙම්පේ, බියගම, කඩුවෙල යන ප්‍රදේශවල පිහිටි ප්‍රසිද්ධ මැහුම් ආයතනවලින් ලබාගෙන, ඒ අනුව තීරණය වන සාමාන්‍ය මිළ සම්පූර්ණයෙන්ම සේවකයන්ට ගෙවීමට සේව්‍යයා එකඟ වේ.

06. ***වාර්ෂික ලාභාංශ මත වූ ප්‍රසාද දීමනා.***– ගිණුම් වර්ෂය අවසානයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කළ පසු, ලැබෙන බදු පසු ශුද්ධ ලාභයෙන් 5% ප්‍රතිශතයක්, ගිණුම් වර්ෂයකට එක් වරක් පමණක්, මෙහෙයුම් ශ්‍රේණිවල සේවක මහත්ම මහත්මීන් හා මෙම සාමූහික ගිවිසුමෙන් ආවරණය නොවන සුපරීක්ෂක/කාර්යාල සේවක මහත්ම මහත්මීන් අතර සමසේ බෙදදීමට සේව්‍යයා එකඟ වන ලදී. මෙම ගෙවීම සම්බන්ධව දැනට බලපවත්නා අනෙකුත් සියළුම කොන්දේසි වෙනස් නොවී බලපවත්වනු ඇත.

07. ***පැමිණීමේ දිරි දීමනා.***– වර්තමානයේ මෙම දීමනාව සඳහා බලපැවැත්වෙන සියලුම කොන්දේසිවලට යටත්ව දැනට මසකට ගෙවනු ලබන රුපියල් 1,500/-ක පැමිණීමේ දිරි දීමනාව, රුපියල් 1,750/- දක්වා වැඩි කිරීමට එකඟ වන අතර, කම්හල් කළමනාකාරිත්වය විසින් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය සිදුකරන බවට ප්‍රකාශයට පත්කරන සියලුම ව්‍යවස්ථාපිත නිවාඩු දිනයක් පැමිණිය යුතු දිනයක් ලෙස සැලකීමට දෙපාර්ශ්වයම එකඟ විය. එමෙන්ම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය සිදුකරන ව්‍යවස්ථාපිත හෝ පෝය නිවාඩු දිනයක් සේවයට වාර්තා කළහොත් එම එක් දිනක් සඳහා රුපියල් 500/-ක මුදලක් පැමිණීමේ දීමනාවට එකතු කිරීමට එකඟ වන ලදී.

08. ***නිෂ්පාදන දිරි දීමනාව.***– නව යෝජිත නිෂ්පාදන දිරි දීමනා ක්‍රමයට දෙපාර්ශ්වයම විසින් එකඟ වේ. (ඇමුණුම අංක I). මෙම නව යෝජිත නිෂ්පාදන දිරි දීමනා ක්‍රමය මාස 06ක කාලයක් අත්හද බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට එකඟ වේ.

09. ***අවමංගල සහනාධාර.***– දැනට පවතින ක්‍රමවේදය වෙනසක් සිදු නොවන අතර, එම ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට දෙපාර්ශ්වයම එකඟ විය.

10. ***වැටුප් තල හා වැටුප් වර්ධක.***– නව යෝජිත වැටුප් තල හා වර්ධකයන් සඳහා එකඟ වන අතර මෙය 201801.06.01 දින සිට ක්‍රියාත්මක වේ. (ඇමුණුම අංක II).

11. ***වෛද්‍ය රක්ෂණ ආවරණය.***– ආයතනයේ සේවය කරන සේවක මහතා හෝ මහත්මියට පමණක් රුපියල් 25,000/-ක රෝහල් ගතවීමක් වෙනුවෙන් පමණක් රක්ෂණ ආවරණය ලබාදීමට සේව්‍යයා එකඟ වේ.

12. ***වෘත්තීය සමිති පහසුකම්.***–

(i) වෘත්තීය සමිති නිලධාරීන්ට එම සමිතියේ කටයුතු සඳහා මසකට රාජකාරි නිවාඩු 02ක් පමණක් ලබාදීමට සේව්‍යයා එකඟ වේ.

(ii) දැන්වීම් පුවරුවක් වෘත්තීය සමිතිය සඳහා ලබාදීමට සේව්‍යයා එකඟ වේ. කෙසේ වුවත් මානව සම්පත් කළමණාකරුගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන පමණක් දැන්වීම් ප්‍රදර්ශනයට එකඟ වේ.

(iii) මසකට වතාවක් මවු ශාඛාවේ නියෝජිතවරයෙකු සමග ආයතනය තුළ ඉදිකෙරෙන නව ආපන ශාලාව තුළ විධායක සභාව පැවැත්වීමට අවසර ලබාදීමට සේව්‍යයා එකඟවේ. ආපන ශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු මෙම පහසුකම ලබා දෙනු ලැබේ.

(iv) වාර්ෂික වෘත්තීය සමිති රැස්වීම සඳහා නිෂ්පාදනයට බාධා නොවන පරිදි වෘත්තීය සමිති සාමාජිකයින් නියමිත දින පැය 3ක කාලයක් නිදහස් කිරීමට සේව්‍යයා එකඟ වේ.

(v) වෘත්තීය සමිති ලිපිගොනු තබාගැනීම සඳහා (cupboard) කබඩ් 01ක් ලබාදීමට සහ එය ප්‍රධාන ආරක්ෂක අංශයේ තැබීමට සේව්‍යයා එකඟ වේ.

13. ඉලක්කගත නිෂ්පාදනය ආවරණය කිරීමට යටත්ව, එක් දින විනෝද චාරිකාවක් ආයතන සේවක මහත්ම මහත්මීන්ට පමණක් ලබාදීමට ද, ක්‍රීඩා දිනයක් ලබාදීම සලකා බැලීමට ද සේව්‍යයා එකඟ වේ.

14. ***ආරාවුල් විසඳීමේ පටිපාටිය.***– මෙම ගිවිසුම මගින් ආවරණය නොවන කරුණක් පිළිබඳව ආරාවුලක් පැන නගින අවස්ථාවක දී පහත දැක්වෙන අයුරින් එම කරුණු නිරාකරණය කර ගැනීමට පාර්ශ්වයන් එකඟ වේ.

(i) පළමුවෙන්, එවැනි ආරාවුල් ආයතන මට්ටමෙන් නිරාකරණය කර ගැනීමට ශාඛා සමිතිය සහ කළමනාකාරීත්වය උත්සාහ දරනු ඇත.

(ii) ඉහත (i) මට්ටමින් ආරාවුල නිරාකරණය කර ගත නොහැකි වූ විටක, එවැනි ආරාවුල් නිරාකරණය කර ගැනීම සඳහා ලංකා සේව්‍ය සම්මේලනයේ දී සහාය ලබාගැනීමට පාර්ශ්වයන් එකඟ වේ.

(iii) ඉහත (ii) මට්ටමින් ආරාවුල නිරාකරණය කර ගත නොහැකි වූ විටක, කාර්මික ආරාවුල් පනතේ විධිවිධානයන්ට අනුව බේරුම්කරන ක්‍රියාපටිපාටියට අනුකූලව ආරාවුල් නිරාකරණය කර ගැනීමට පාර්ශ්වයන් එකඟ වේ.

(iv) ඉහත (iii) මට්ටමින් ආරාවුල නිරාකරණය කර ගත නොහැකි වන අවස්ථාවල වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීමට ප්‍රථම දින 14ක පූර්ව ලිඛිත දැනුම් දීමක් කිරීමට වෘත්තීය සමිතිය එකඟ වේ.

15. ඉහත ප්‍රකාශිත ආරාවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය නොපිළිපදිනු ලබන්නේ නම් කිසියම් දැනුම් දීමකින් තොරව වෘත්තීය සමිති සාමාජිකයන්ගේ මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර යැවීමේ පහසුකම (check-off) අහිමි කිරීමට සේව්‍යයා සහ වෘත්තීය සමිතිය එකඟ වේ.

16. මෙම ගිවිසුම බල පැවැත්වෙන කාලය තුළ දී මෙම එකඟ වී ඇති කොන්දේසි හා නියමයන් කිසිදු අයුරකින් වෙනස් කිරීමට උත්සාහ නොකරන බවට හා මෙම ගිවිසුමේ සඳහන් කිසිදු කරුණක් සම්බන්ධයෙන් ඇතිවන ආරාවුල සම්බන්ධයෙන් කිසිදු ආකාරයක වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට අවතීර්ණ නොවීමට, මෙම ගිවිසුමෙන් බැඳී සිටීමට හා ආවරණය වන වෘත්තීය සමිතිය, සේව්‍යයා හා සේවකයන් එකඟ වේ.

වර්ෂ 2018 ජූනි මස 12 වන දින වූ මෙදින මෙම ගිවිසුමේ පාර්ශවකරුවන් සාක්ෂි වශයෙන් පහත සඳහන් අය අත්සන් තබන ලදී.

| | |
|---|---|
| ................................ | ................................ |
| ස්විස්ටෙක් ඇලුමිනියම් ලිමිටඩ් | අන්තර් සමාගම් සේවක සංගමය |
| වෙනුවෙන් | වෙනුවෙන් |
| නම: J A P.H ජයසේකර | නම: වසන්ත සමරසිංහ |
| තනතුර: කළමනාකාර අධ්‍යක්ෂ | තනතුර: සභාපති. |

සාක්ෂිකරුවෝ:

| | |
|---|---|
| 1. ................................ | 1. ................................ |
| නම: | නම: L.A සමන් පුෂ්ප කුමාර |
| තනතුර: | තනතුර: සභාපති |
| 2. ................................ | 2. ................................ |
| නම: නිහාල් කුමාරසිංහ | නම: පී.ඩබ්. රංජිත් කරුණා |
| තනතුර: නි: කාර්යාධිකාරී. | තනතුර: ලේකම් |

**SWISSTEK ALUMINIUM LIMITED**
**For Operative Category Employees**
**SALARY SCALES w.e.f. 01.06.2018**

(W.thout Budgetary Relief Allowance I Rs.1,000/- and Budgetary Relief Allowance II Rs.2,500/-)

**OPERATIVE Category EMPLOYEES**

| | |
|---|---|
| GRADE V | Rs.12,150/- (125/-x30) + (150/-x150) = 38,400/- |
| GRADE IV | Rs.13,150/- (150/-x30) +(175/-x150) = 43,900/- |
| GRADEIII | Rs.14,150/- (175/-x30) + (200/-x150) = 49,400/- |
| GRADE II | Rs.15,150/- (200/-x30) + (225/-x150) = 54,900/- |
| GRADE I | Rs.16,150/- (225/-x30) +(250/-x150) = 60,400/- |
| Fixed Term Contract Employees | Rs.11,000/- |
| Casual Employees | Rs. 710/- Per Day (BRA I - Rs.40/-, BRA II - Rs.100/-) |

**QUALITY ASSUARANCE EMPLOYEES**

| | |
|---|---|
| GRADE IV | Rs.13,650/- (150/-x30) +(175/-x150) = 44,400/- |
| GRADEIII | Rs.14,650/- (175/-x30) + (200/-x150) = 49,900/- |
| GRADE II | Rs.15,650/- (200/-x30) + (225/-x150) = 55,400/- |
| GRADE I | Rs.16,650/- (225/-x30) +(250/-x150) = 60,900/- |

**TECHNICIANS**

| | |
|---|---|
| GRADE IV | Rs.13,650/- (150/-x30) +(175/-x150) = 44,400/- |
| GRADEIII | Rs.14,650/- (175/-x30) + (200/-x150) = 49,900/- |
| GRADE II | Rs.15,650/- (200/-x30) + (225/-x150) = 55,400/- |
| GRADE I | Rs.16,650/- (225/-x30) +(250/-x150) = 60,900/- |

01/06/1

Annexure 1

**Proposed Production Incentive Scheme - Swisstek Aluminium Limited.**

| [redacted] | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 100 | 11,400 | 12,400 | 13,200 | 13,800 | 14,200 | 14,500 | 15,100 | 16,000 | 17,200 | 18,800 | 20,800 | 23,200 | 26,000 |
| | 95 | 10,830 | 11,780 | 12,540 | 13,110 | 13,490 | 13,775 | 14,345 | 15,200 | 16,340 | 17,860 | 19,760 | 22,040 | 24,700 |
| | 90 | 10,260 | 11,160 | 11,880 | 12,420 | 12,780 | 13,050 | 13,590 | 14,400 | 15,480 | 16,920 | 18,720 | 20,880 | 23,400 |
| | 85 | 9,690 | 10,540 | 11,220 | 11,730 | 12,070 | 12,325 | 12,835 | 13,600 | 14,620 | 15,980 | 17,680 | 19,720 | 22,100 |
| | 80 | 9,120 | 9,920 | 10,560 | 11,040 | 11,360 | 11,600 | 12,080 | 12,800 | 13,760 | 15,040 | 16,640 | 18,560 | 20,800 |
| | 75 | 8,550 | 9,300 | 9,900 | 10,350 | 10,650 | 10,875 | 11,325 | 12,000 | 12,900 | 14,100 | 15,600 | 17,400 | 19,500 |
| | 70 | 7,980 | 8,680 | 9,240 | 9,660 | 9,940 | 10,150 | 10,570 | 11,200 | 12,040 | 13,160 | 14,560 | 16,240 | 18,200 |
| | 65 | 7,410 | 8,060 | 8,580 | 8,970 | 9,230 | 9,425 | 9,815 | 10,400 | 11,180 | 12,220 | 13,520 | 15,080 | 16,900 |
| | 60 | 6,840 | 7,440 | 7,920 | 8,280 | 8,520 | 8,700 | 9,060 | 9,600 | 10,320 | 11,280 | 12,480 | 13,920 | 15,600 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 68 | 69 | 70 | 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |

[redacted]

Checked
28/05/18

12/6/18

28/5/18



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.